# දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු

කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය විසින් පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකාවේ අපේක්ෂකයන් වෙතින් 2021 මාර්තු 15 වෙනි දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. තාක්ෂණ නිලධාරී තනතුර (ICT) III වන ශ්‍රේණිය (ඇබෑර්තු 02 යි)

**සුදුසුකම් :**

(i) ඕනෑම ධාරාවකින් එක් වාරයකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී විෂයන් තුනකින් (03) සමත්ව තිබීම

සහ

(ii) තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණය / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය / තොරතුරු තාක්ෂණ හා සමාන ක්ෂේත්‍රයක තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන (NVQ Level 05) මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳව පළපුරුද්දක් සහිත අයවලුන්ට විශේෂත්වයක් දක්වනු ලැබේ.

## 02. තාක්ෂණ නිලධාරී තනතුර (ශ්‍රව්‍ය දෘෂ්‍ය) III වන ශ්‍රේණිය (ඇබෑර්තු 01 යි)

**සුදුසුකම් :**

(i) ඕනෑම ධාරාවකින් එක් වාරයකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී විෂයන් තුනකින් (03) සමත්ව තිබීම

සහ

(ii) (අ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හෝ පාර්ලිමේන්තුව විසින් පනතක් සම්මත කිරීම මගින් පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් විසින් පිළිගනු ලබන ආයතනයක් විසින් ඉලෙක්ට්‍රොනික හා සන්නිවේදන / ඉලෙක්ට්‍රොනික විද්‍යාව / බහුමාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන (NVQ Level 05) මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම

හෝ

(ආ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඉහත (ii) (අ) සඳහන් සුදුසුකමට සමාන යයි පිළිගනු ලබන ඉලෙක්ට්‍රොනික හා සන්නිවේදන / ඉලෙක්ට්‍රොනික විද්‍යාව / බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ තාක්ෂණික සුදුසුකම් ලබාගැනීමෙන් පසුව පිළිගත් ආයතනයක ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩ පිළිබඳව වසරක පළපුරුද්දක් ලබා තිබීම.

- **තෝරාගනු ලබන ක්‍රමය :** ලිඛිත සහ / හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.
- වැටුප් පරිමාණය : 2020.01.01 දිනට රු. 31,625 - 7 x 300; 10 x 355 - 37,275 (මාසිකව) U-MT 1(IIIA)
- **වයස් සීමාව :** වයස අවුරුදු 18 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය.

ඉහත වැටුපට අමතරව, ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

**අනෙකුත් ප්‍රතිලාභ**

- විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල : සේවා යෝජකයා විසින් විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල සඳහා මාසික මූලික වැටුපෙන් 7% කට සමාන මුදලක දායකත්වයක් ලබා දෙන අතර, විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල සඳහා සේවකයා විසින් මාසික මූලික වැටුපෙන් 10% කට සමාන මුදලක දායකත්වයක් ලබා දිය යුතුය.
- විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය : විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා සේවා යෝජකයාගේ දායකත්වය මාසික මූලික වැටුපෙන් 10% ට සමාන මුදලක්
- සේවක භාරකාර අරමුදල : සේවක භාරකාර අරමුදල සඳහා සේවා යෝජකයාගේ දායකත්වය මාසික මූලික වැටුපෙන් 3% ට සමාන මුදලක්

**වැදගත්**

- උසස් අධ්‍යාපන ආයතන / රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය.
- අදාළ සුදුසුකම් සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා ඉදිරිපත් කළ යුතුය.
- ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, නියමිත ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත් නොකළ අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ආයතනයේ www.iim.cmb.ac.lk යන වෙබ් අඩවියෙන් අයදුම්පත බාගත කරගත හැකිය.
- නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්, 2021.03.15 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **"සහකාර ලේඛකාධිකාරී / ආයතන, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ අයදුම්පතේ මෘදු පිටපතක් (PDF සහ WORD පිටපත්) recruit@iim.cmb.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතුය.
- අයදුම්කරන තනතුර අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ,**
**දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,**
**කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය.**
**2021.02.15**